Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**දේශීය ශාන්තිකර්ම**

ශාන්තිකර්ම කුමන කාලයේ ආරම්භ වුවා ද යන්න නිශ්චිතව ම ප්‍රකාශ කළ නො හැක. ආදි මානවයා පරිසරයේ සිදුවන වෙනස් වීම් අවබෝධ කර ගැනීමට තරම් විද්‍යාත්මක අවබෝධයක් නොමැති වූ නිසා ඒවා අදෘශ්‍යමාන බලවේගයන් විසින් පමුණුවන්නේ යැයි සිතා ඒවා දේවත්වයෙන් සලකන්නට විය. උදාහරණ ලෙස,

හිරු නැගීම බැසීම ,හඳ පෑයීම, වර්ෂාව, නියඟය ආදිය අදෘශ්‍යමාන බලවේග යැයි සිතා වෘක්ෂ දෙවියන් ආදී ලෙසට වන්දනාමාන කර තිබේ.ඒ අනුව පෙර ගම්බද ගැමි ජනයා අතර ඇදහිලි හා විශ්වාස පදනම් කරගෙන ශාන්තිකර්ම ආරම්භ විය. මේවා,

*උඩරට ශාන්තිකර්ම

*පහත රට ශාන්ති කර්ම

*සබරගමු ශාන්තිකර්ම

ලෙසට වර්ගීකරණයක් කර ඇත. ඒ පවතින ප්‍රදේශ අනුවයි. කෙසේ වෙතත් වර්තමානයේ මෙන් විනෝදාශ්වාදය මත පමණක් නොව එකල ශාන්ති කර්ම පවත්වා ඇත්තේ, රෝග පීඩා, ස්වභාවික විපත්, වස්දොස් දුරු වීම් මෙන්ම සශ්‍රීකත්වය සඳහා ය. එය තුළ තිබූ නැටුම්, රඟුම්, ගායන වාදන ගැමියන්ගේ විනෝදාස්වාදයට හේතු විය.මෙම ශාන්තිකර්මයක් සන්ධ්‍යාවේ ආරම්භ වී පසුදා පහන්වන තුරුත්, ඇතැම් විට පසුදා දිවා භාගය වන තුරු පවත්වා ඇත. මෙම ශාන්තිකර්මයන් තුළ නැටුම් අවස්ථා මෙන්ම නාට්‍ය ජවනිකා ව ද දක්නට ලැබීම විශේෂත්වයකි. දේව භක්තියෙන් යුතුව දෙවියන්ට වැදුම් පිදුම් කොට ශාන්තිකර්ම ආරම්භ කරන අතර මේ සෑම ශාන්තිකර්මයක් ම පොදු හෝ පෞද්ගලික වශයෙන් කොටස් දෙකකට බෙදා දැක්විය හැක.

කොහොඹ කංකාරිය (හැටපස් මංගල්‍යය)

*සම්ප්‍රදාය - උඩරට සම්ප්‍රදාය

*පරමාර්ථය - සශ්‍රීකත්වය සෞභාග්‍යය

*පවතින ප්‍රදේශ - මධ්‍යම පළාතේ සත්කෝරලය, සතර කෝරළය, දුම්බර,

හේවාහැට, උඩුනුවර, යටි නුවර, කෑගල්ල, මහනුවර, කුරුණෑගල

*පුද ලබන දෙවිවරු - කොහොඹ දෙවියන්, පරණ කොහොඹ දෙවියන්, කන්දේ බණ්ඩාර

කළුබණ්ඩාර, වීරමුණ්ඩ

*ප්‍රධාන වාද්‍ය භාණ්ඩය - ගැට බෙරය ( මඟුල් බෙරය, උඩරට බෙරය )



*ප්‍රධාන ඇඳුම් කට්ටලය - වෙස් ඇඳුම් කට්ටලය



## කොහොඹා කංකාරිය හා සම්බන්ධ ප්‍රධාන කතා පුවත

මෙම කංකාරිය ආරම්භය පිළිබඳව කතාපුවතක් නැතහොත් උපත් කතාවක් නැතහොත් පුරාවෘත්තයක් පවතී. එම උපත් කතාව පිළිබඳව කුවේණි අස්න, සිහබා අස්න, රාජාවලිය නැමැති කෘතීන් තුළ සඳහන් වේ.

විජය රජු කුවේණිය ට දුන් පොරොන්දු කඩ කොට දරු දෙදෙනාත් සමඟ ඔවුන්ව පලවා හැරීම නිසා කුවේණිය විසින් රජුට ශාප කරන ලද බව කියවනු ලැබේ. විජයට කළ මෙම ශාපය පසුව රජ වූ පඬුවස්දෙව් නැතහොත් පණ්ඩුවාසුදේව රජුට බලපා ඇති බව සඳහන් වේ. ඒ අනුව පණ්ඩුවාසුදේව රජුට දිවි දෝෂයක් වැළඳුණේ ලු. එනම් සිහිනෙන් දිවියෙක් පැමිණ පහුරු ගෑමයි. මෙම සිහිනය නිසා රජු බොහෝ පීඩා විඳ තිබේ. මෙය දුටු දෙවිඳුවක් සක්‍ර දෙවියන්ට සැල කළේලු. සක්‍ර දෙවියන් රාහු අසුරේන්ද්‍රයා ගෙන්වා මේ සඳහා මවු කුසින් නොව මලෙන් උපන් මලය රජු ගෙන් වා යාගයක් කළ යුතු බව පවසයි. ඒ සඳහා උපක්‍රම යෙදූ සෙනසුරු ඌරු වේශයක් ගෙන මලය රජුගේ උයනට ගොස් උයන පාළු කළේලු. පසුව මලය රජු හා ඔහුගේ පිරිස ඌරා මරාදැමීමට පසුපස ලුහු බැඳි අතර ඌරා හන්තාන අඩවියේ දී තනි වූයේලු. රජු ඌරාට කඩුවෙන් කෙටීමට යනවිට උරා කළු ගලක් බවට පත් වූවා ලු. අනතුරුව රාහු අසුරේන්ද්‍රයා පැමිණ රජුට කරුණු පැහැදිලි කර රජුව කැඳවාගෙන ගොස් කංකාරි මඩුවක් පවත්වා පණ්ඩුවාසුදේව රජුව සුවපත් කළේලු. මලය රජු තමාට නැවත පැමිණිය නොහැකි බව පවසා ඒ සඳහා සුදුසු දේව මණ්ඩලයක් ලංකාව තුළ පත්කර ආපසු යන්නට ගියේලු. එම දේව මණ්ඩලය සඳහා නව දෙනෙකු පත් කළ බවත් සඳහන් වේ. එනම් මහා කොහොඹා, පරණ කොහොඹා, ඉරුගල්බණ්ඩාර, කන්දේ බණ්ඩාර, කළුබණ්ඩාර, වීරමුණ්ඩ, මලෙයි යකා, කඩවර යකා, වැදි යකා.

මෙලෙස ආරම්භ වූ කොහොඹ කංකාරිය ශාන්තිකර්ම අද දක්වාම ව්‍යාප්ත වූ ආකාරය දැකගත හැකි වේ. මෙම ශාන්තිකර්මය තුළ නර්තනාංග 23ක් හා ජවනිකා 15ක් අන්තර්ගත වේ. නර්තනාංග ලෙසට අස්නේ, යක් පදය, දුම්මල පදය, ආවැන්දුම, මල් පදය ආදිය හඳුන්වා දිය හැකි අතර ජවනිකාව 15 අතර නාට්‍යමය ලක්ෂණ සහිත ජවනිකා කිහිපයක් වැදගත් වේ.

## කොහොඹා කංකාරිය ශාන්තිකර්මයේ නාට්‍යමය ලක්ෂණ සහිත ජවනිකා

*යක්කම් පහ (ඌරා යක්කම, නයා යක්කම, වැදි යක්කම, සීතා යක්කම, දර්පණ යක්කම )

*කතා 5 ( මලය රාජ කතාව, විජය රාජ කතාව, පණ්ඩුවාසුදේව කතාව, දඩුමොනර කතාව,
කුවේණි කතාව )

*දාන පහ (එලවැල දානය, දිවි දානය, ඌරු දානය, වැදි දානය, සුරබි දානය )

*ගුරුගේ මාලාව

* ගබඩා කොල්ලය

* වැද්දන්ගේ විසීම

*මුව මල විදීම

ඉහත නාට්‍යමය ජවනිකා ඉදිරිපත් කිරීම සඳහා නාට්‍යමය ලක්ෂණ පදනම් කරගන්නා අතර හාස්‍ය, උපහාසය මගින් ප්‍රේක්ෂකයාට රසවින්දනය මතු කිරීමට උත්සාහ කරයි. ශාන්තිකර්ම තුළ විශේෂ ලක්ෂණයක් වන්නේ සියලුම ගැහැණු චරිත පිරිමින් විසින්ම රඟදැක්වීමයි. ඒ හරහා හාස්‍ය මතු කරමින් රැයක් එළිවන තුරු ප්‍රේක්ෂකයින් රඳවා ගැනීමට හැකියාව ලැබී ඇත.

ජවනිකා තුළ පවතින නාට්‍යමය අවස්ථා

*දෙබස් සංවාද භාවිතය

*චරිත නිරූපණය

*අවස්ථා නිරූපණය

*අනුකරණ

*සමාරෝප

*සතර අභිනය භාවිතය

*රංග භාණ්ඩ උපකරණ භාවිතය

*රංග භූමි අලංකරණය





*ප්‍රේක්ෂක සහභාගිත්වය

ඉහත නාට්‍යමය ලක්ෂණ බහුල කොහොඹා කංකාරියට අයත් ප්‍රධාන ජවනිකාව වන්නේ යක්කම් 5 ජවනිකාවයි. ඉන් ඌරා යක්කම, නයා යක්කම, වැදි යක්කම යන අවස්ථා තුළ නාට්‍යමය ලක්ෂණ ප්‍රබල වේ.

ඌරා යක්කම

මෙයින් නිරූපණය වන්නේ කංකාරි පුවතට අනුව මලය රජුගේ උයන පාළු කළ ඌරා ඇල්ලීමට යන අවස්ථාවයි.යක්දෙස්සන් බෙර වාදකයින් අතර සංවාද ඇති කර ගනිමින් හාස්‍ය ලෙස නිරූපණය කරයි. මෙහිදී ඌරා නිර්මාණය කිරීමට කෙසෙල්බඩ කන්දකට ලී කෝටු හතරක් ගසා කකුල් ලෙසට පෙන්වා ඌරෙකුගේ

අනුරුව නිරූපණය කරයි. එහිදී ඌරා මරණයට පත් කරමින් එම ඌරු මස් ඉතා අසාධාරණ ලෙස සියලු දෙනාටම බෙදෙන අයුරු උපහාසාත්මක ව නිරූපණය කරයි. උරා මැරීමට යොදා ගන්නා ඊතලය තැනූ බාස්ට, කුඹල් කරුට, අසාධාරණ ලෙස මස් බෙදෙන අයුරුත් අනෙක් ලොකු ලොක්කන්ට විශාල මස් කැබලි මෙන්ම මස් ගාත් ලබා දෙන අයුරුත් හාස්‍ය ලෙස නිරූපණය කරයි. මේ තුළ පද පෙරළා කීම්, දෙපිට කැපෙන වචන භාවිතය ආදිය හරහා හාස්‍ය උපදවයි. ශාන්තිකර්ම නැරඹීමට පැමිණෙන ගම් මුලාදෑනියාට නොදැනෙන ලෙසට සමච්චල් කිරීම ශාන්තිකර්ම තුළ දක්නට ලැබේ.

<u>ඌරාට විදින්නට සැරසෙන විට ඇතිකරගන්නා සංවාදයක්</u>

1යක්දෙස්සා - ඌරා විද ගන්නේ කොහොමද?

2 යක්දෙස්සා - දඩ මීමෙක් ඇතුව

1යක්දෙස්සා - ජඩ මීමෙක්..?

2 යක්දෙස්සා - නෑ බොල දඩ මීමෙක්

<u>බාබරේට මස් ලබාදෙන සංවාදයක්</u>

යක්දෙස්සා - ඒ බොල මේං පනික්කියා ඇවිල්ලා ඉන්නවා

මස් කරන්නා - බාබරේට මොකටද මස් දෙන්නෙ?

යක්දෙස්සා - ඇයි රැවුල කැපුවට

මස් කරන්න - මේකා මගේ රැවුල කපන්න කියලා ඇදගෙන ගිහින් මාව ගහකට හේත්තු කරලා රැවුල් ගස් උඩින් කොටා දානකොට මං කිව්වා බාබරේ වතුර ටිකක් ගාලා කපන්න කියලා. එතකොට මූ කිව්වා වතුර ගන්නේ තොගේ ඇහෙන්මයි කියලා

යක්දෙස්සා - ඒ උනාට ඉතින් මස් කෑල්ලක් දෙන්න එපායැ

<u>කුඹල් කාරයාට කියන කවියක්</u>

වැඩ පෙළ කළේ තැනුවේ අඹුවත් එක්ක
හැඩ වැඩ බලා තැළුවේ දාගෙන ඔක්ක
මට ගුලි ගෙනත් පෙරළා ඉඳගෙන වක්ක
බඩහැල මලේ අරගෙන පලයන් බොක්ක

<u>ඊතලය සෑදූ බාස්ට කියන කවි</u>

වතගොත නොදැන මම ගන්නෙ ලී දණ්ඩ
අතපය රිදුනාම තැනූ යෙදුණු දණ්ඩ
වතගොත නොදැන මොකවත් ආවේ යන්ඩ
අත පුළුව ට දෙමි කකුලේ තනි අන්ඩ

ගුරේ මෙනුඹ මම කී දේ අසාපන්
දොර ඇර යකඩ තලලා තවාපන්
වැර සම තදින් ඇදලා තලාපන්
කුරේ කපලා දෙන්නට කියාපන්

<u>නයා යක්කම</u>

මෙහිදී නිරූපණය වන්නේ සෝලියගුරුට දානයක් කරගෙන යන අතරතුර නයෙක් දෂ්ට කිරීමේ කතා පුවතකි.

මුලින්ම වී කෙටීම, හාල් පෙළීම, ලිප් ගල් බැඳීම, දානය සැකසීම අනුකරණාත්මක ව ඉදිරිපත් කරමින් පසුව දානය කදක රැගෙන යන අතරතුර එම පුද්ගලයාට මහන්සියට ගසක් යට නින්ද යයි. ඒ අතරතුර කදෙහි තිබූ ආහාරවල සුවඳට තුඹසින් එළියට එන නාගයෙක් එම පුද්ගලයාගේ කකුලට දශ්ඨ කරයි. පසුව යක් දෙස්සෙක් පැමිණ විශ ඉවත් කරන අයුරු හාස්‍යජනකව ඉදිරිපත් කරයි. ඒ සඳහා යක්දෙස්සන් දෙබස්, සංවාද, අනුකරණ, සමාරෝප, සතර අභිනය ආදිය භාවිතා කර ගනිමින් ප්‍රේක්ෂකයන් පිනවීමට උත්සාහ දරයි. මෙහිදී නාගයා නිරූපණය කිරීම සඳහා

රෙදි කැබලි වලින් තැනූ අනුරුවක් හෝ ලීයෙන් තනන ලද නාගයකුගේ අනුරුවක් යොද ගනියි. පසුව කවි ගායනා හරහා ආතුරයාට බැඳගත් වෛරය නයා විසින් දුරු කර ගත් බව එම ජවනිකාවෙන් ඉස්මතු කරයි. ඔහුට නාගයා දෂ්ඨ කලේ පෙර වෛරය නිසා බවත් අදින් පසු එම වෛරය අවසන් වූ බවත් මින් පෙන්වා දෙයි. මේ ජවනිකා සියල්ල සිදු කරන්නේ කවි ගායනා කරමින් බෙර තාලයට අනුවයි.

<u>නයා යක්කම ට අදාල දෙබස් සංවාද ඛණ්ඩයක්</u>

යක්දෙස්සා - හපොයි හපොයි බොලන්නේ මොකද බොලන්නේ?

ගුරුන්නාන්සේ - මොකද මොකද බොල?

යක්දෙස්සා - හපොයි මට මහ ලෙඩේ හැදිලා ගුරුන්නාන්සේ බඩ වැල ගෙඩියක් වගේ. දනත් නැමෙනවා

ගුරුන්නාන්සේ - මහ ලෙඩේ හැදෙන්නේ නරක කාලෙටනේ

යක්දෙස්සා - ඉතින් ඒකට මොකද කරන්නෙ ගුරුන්නාන්සේ?

ගුරුන්නාන්සේ - ඕකට ඉතින් සෝලිය ගුරුට බාරහාර වෙලා දානයක් දෙන්න ඕනේ

යක්දෙස්සා - අපි දන් දෙන්නේ හාමුදුරුවන්ට

ගුරුන්නාන්සේ - ඔව් උඹ හිටිය පන්සලේ නොවැ

යක්දෙස්සා - කොහොමද මේ දානෙ දෙන්න ඕනේ

ගුරුන්නාන්සේ - සම්මාදම් කළ දෙන්න ඕනේ

<u>නයා යක්කමට අදාල වී වනන අයුරු නිරූපණය කරන කවියක්</u>

ලාසක් විතර වී අව්වේ වනාලා
දොලසක් විතර ඇඟ ගෝමර ඉසීලා
අතක් දිගට නිල් වරලස මිදීලා
කතක් සිටි වී අව්වේ වනාලා

සම්මාදමේ යන විට ගායනා කරන කවියක්

සම්මාදමේ අපි යනවා බොලන්නේ

සම්මාදම ට මොකවත් ලැබෙනු අනේ

පමා නැතිව සම්මාදම් දෙනු ය අනේ

සෝලිය ගුරුට දානෙට මොකවත් ලැබෙනු අනේ

මේ ලෙසට කවි ගායනා කරමින් බෙර පද තාලයට අනුව සියලුම ක්‍රියාවලියන් නිරූපණය කරයි. ඒ සඳහා අනුකරණය, සමාරෝප, සතර අභින භාවිතය වැනි නාට්‍යමය ලක්ෂණ යොදා ගනී. මෙම අවස්ථාව සඳහා මුකරි සංවාද, හාස්‍ය දෙබස් සංවාද යොදාගනී.

වැදි යක්කම

මෙම අවස්ථාව වැද්දන් ගිවිස්සීම ලෙසද හඳුන්වනු ලබයි. ශාන්තිකර්මය පවත්වාගෙන යාමට වැද්දන්ගේ සහාය ලබා ගැනීම ද අරුම අරමුණ වී ඇති බව පැහැදිලි වේ. ඔවුන්ට කෑම බීම ලබාදී ඔවුන් වැදගත් පරපුරකින් පැවත එන බව ගෞරවයෙන් මෙහිදී පෙන්වා දෙයි. වැද්දන් ලෙස සමාරෝපය වන යක්දෙස්සන් සුදුසු රංග වස්ත්‍ර වලින් සැරසී එනම් යටි කය පමණක් වැසෙන සේ වනචාරීන් ලෙස හුවා දැක්වේ.මේවා හාස්‍යජනක ලෙස නිරූපණ ලෙසින් ඉදිරිපත් කරන නිසා ප්‍රේක්ෂකයින්ට හාස්‍ය උපදවන ජවනිකා වේ. කෙතරම් නහවා කවා පොවා පිරිසිදු කළ ද වැද්දන් අවසානයේ හූ හඬ දී කෑ ගහන අයුරු හාස්‍යජනක ව ඉදිරිපත් කරයි. මේ සඳහා කවි ගායනා මෙන්ම දෙබස් සංවාද යොදාගනු ලබයි.

වැදි යක්කමේ යෙදෙන දෙබස් ඛණ්ඩයක්

යක්දෙස්සා - මූ කවුද?

බෙරකරු - මූ වැද්දා බණ්ඩාර වැද්දා

යක්දෙස්සා - නෑ මූ නිරි වැද්දෙක්

බෙරකරු - (කෙසෙල් ගෙඩි දෙකක් ලෙලි ගසා) මුට කැවුම් කෙසෙල්ගෙඩි දෙන්න

ඕනේ. ආදර පක්ෂ ඇතිව දෙන්ඩ ඕනේ.

යක්දෙස්සා - ආදර පස්ස ඇතිව (පස්ස පැත්ත වැද්දාගේ මුහුණේ වද්දමින්)

මේ ලෙසට ජවනිකාව පුරාම හාස්‍යඋත්පාදක සංවාද චරිත නිරූපණ ඉතා සාර්ථකව ඉදිරිපත් කරනු ලබයි. මෙසේ කැවුම් කෙසෙල් දෙන අන්දම නිරූපණය කරන අතර වැද්දන් ඒවා අනුභව කරන අයුරු හාස්‍යජනකව ඉදිරිපත් කරන අතර පසුව වැද්දන් විසින් විකට සංවාද, පදපෙරලි, දෙපිට කැපෙන වචන හාස්‍ය ලෙස යොදාගෙන වැද්දන් කොළ අතු ගෙන නටමින් ආයු බෝ වේවා යැයි සෙත් පතමින් ජවනිකාව අවසන් කරයි.

<u>ගුරුගේ මාලාව</u>

මෙයද යක් දෙස්සෙක් හා බෙරවාදකයෝ අතර ඇති වන සංවාදයකින් ආරම්භ වේ. එහිදී යක් දෙස්සෙකු නල්ල සාමි ගුරුගේ භූමිකාව නිරූපණය කරන අතර අනිත් බෙරකරු සමග ඔබ මොබ යමින් සංවාදයෙහි යෙදේ. නල්ල සාමි යන චරිතය ගුරු විදේශිකයෙකු ලෙස පෙනී සිටින අතර වචන වරද්දා කීම් හරහා හාස්‍ය රසය උපදවන අතර මෙම අවස්ථාවේදී සංවාදයට වැඩි ස්ථානයක් හිමිවන බව දක්නට ලැබේ.

<u>ගබඩා කොල්ලය</u>

කොහොඹා කංකාරිය පැවැත්වීම සඳහා ගමේ ජනයාගෙන් සම්මාදම් කර ගත් හාල්, පොල්, තැඹිලි, කෙසෙල්, එළවළු ආදිය තැන්පත් කර තිබෙන ස්ථානය ගබඩාවයි. මෙහිදී යක්දෙස්සා ගබඩාවට පැමිණ ගබඩාවේ තිබූ බඩුමුට්ටු පිළිබඳව විමසමින් හාස්‍ය ආකාරයේ සංවාද ඇති කර ගනියි. අවසානයේ ඉතිරි වී ඇති භාණ්ඩ යක්දෙස්සන් ට බෙදා දී ගබඩාවට ගිනි තබා දෝශ දුරුවූ බව සංකේතවත් කරමින් දුම්මල කීරි ගසයි. මෙම චාරිත්‍රයෙන් වස්දොස් දුරු වූ බව අපේක්ෂා කරයි.

<u>මුව මල විදීම</u>

අයිලය අසල සිටුවා ඇති කෙසෙල් ගසක මුවයට විද දුන්න කඩා දැමීමක් මෙයින් සිදුවන අතර කංකාරිය හමාර කිරීමේ චාරිත්‍රය මින් අපේක්ෂා කරයි.

https://www.youtube.com/watch?v=pnFjalAFyuA&t=6s

https://www.youtube.com/watch?v=b9K18_XKHgM

https://www.youtube.com/watch?v=b9K18_XKHgM

https://www.youtube.com/watch?v=ryyGBEkulO0